'බුදු දහමට අපහාස කිරීම සහ කලාකරුවන්ගේ ප්‍රකාශන නිදහස' සම්බන්ධයෙන් මතුව ඇති සංවාදය රට මුහුණ පා සිටින සමාජ සංස්කෘතික අර්බුධයේ තවත් එක් පැතිකඩක් ප්‍රකට කන්නකැයි කිව හැකිය. නූතන තාක්ෂණික දියුණුවත් සමඟ මාධ්‍ය ඔස්සේ සමාජය ආමන්ත්‍රණය කිරීමට පුරවැසියන්ට ලැබී ඇති පුළුල් අවකාශය සහ නිදහසත්, ඒ තුළ පුරවැසියන්ගේ මෙන්ම පාලකයන්ගේ භූමිකාත් විමසා බැලීමට කවුළුවක් එමගින් විවර කොට තිබේ. 'බුදුන්ගේ රස්තියාදුව' පොතේ කර්තෘ කේ.කේ. ශ්‍රීනාත් සමඟ වන මේ සාකච්ඡාව පුරවැසියාගේ භූමිකාව වෙත එබිකම් කිරීමකි.

'බුදුන්ගේ රස්තියාදුව' මගේ ආච්චිට ලියපු පොතක්

කේ.කේ. ශ්‍රීනාත්

සාකච්ඡා කළේ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

ඔබම ඔබ පිළිබඳව හඳුන්වාදීමක් කළොත් ?

සිනමාව ගැන අධ්‍යනය කරන කෙනෙක් විදිහට මම මා හඳුන්වා දෙන්න කැමතියි. 2007 වසරේදි සිනමාකරුවෙක්වීමේ අරමුණෙන් ජාතික චිත්‍රපටි සංස්ථාවේ ඩිප්ලෝමා එක කළා. එහිම අවශ්‍යතාවක් ලෙස පසුව දර්ශනවාදය, මනෝ විශ්ලේෂණය, සංඥාර්ථවේදය ආදී විෂයන් ඉගෙන ගන්නට යොමුවුණා.

ඒ විෂයයන් කොහෙන්ද හැදෑරුවේ ?

අපි අපේම ගෘප්ස් හදාගෙනයි ඒවා හැදෑරුවේ. ඒ කියන්නේ අපි කිහිප දෙනා බැගින් එකතුවෙලා සිනමාව ගැන හැදෑරීමේ කව හදාගත්තා. ප්‍රභාත් චම්න්ද, සමීර තිලකවර්ධන, රොහාන් පෙරේරා තුන්දෙනා තමයි අපේ ගුරුවරු. අපි සිනමාව ගැන මැගසින් එකක් කළා. සිනමාව සහ කලාව තමයි මගේ හැදෑරීම් විෂය ක්ෂේත්‍රය වුණේ.

ග්‍රන්ථ කර්තෘවරයෙක් වුණේ ?

මම නවකතාකරුවෙක් වෙන්න කවදාවත් හිතුවේ නෑ. අවුරුද්දකට කලින් නොහිතපු වෙලාවක සන්නස්ගල මට කියනවා 'ශ්‍රීනාත් දැන් ඔයා පොතක් ලියන්න කාලය හරි' කියලා. ඒ වෙනකොට මම ගද්‍ය සහ කවිය යැයි කිය හැකි දේවල් ලියනවා. ඒවායින් සමහර ඒවා ෆේස් බුක් එකේ පලකළා. ගොඩක් ඒවා මගේ සටහන් පොත්වලම තමයි ඇතුළත් වුණේ. තවමත් පොත්වල ඒවා තියනවා මාධ්‍යවල පලකළේ නෑ. දර්ශනවාදයයි කලාවයි අතර මැද ලියැවිලි තමයි මගේ ස්ටයිල් එකේ තිබුණේ. මේවා දැකලා තමයි සන්නස්ගල මට පොතක් ලියන්න කිව්වේ.

මොන පොතක්ද ලියන්න කිව්වේ ?

පොතක් ලියන්න කිව්වාට මොන පොතක්ද ලියන්න ඕනේ කියලා කිව්වේ නෑ.

සන්නස්ගල හඳුනාගැනීම සිදුවුණේ කොහොමද?

සංහිඳ ප්‍රකාශන හිමිකරු සහ සිංහල ගුරුවරයෙක් විදිහට මම ඔහුව දැනගෙන හිටියා. එයාගේ ගෝලයෝ ගොඩක් හිටියා මගේ යාලුවෝ අතරේ. සන්නස්ගල ගුරුවරයෙක් විදිහට ඒ කාලේ ඉඳළම මගේ යාලුවන්ගේ ඔලුවලට කළ බලපෑම් මම දැනගෙන හිටියා. 'අලුත් පරපුර' කලා සංවිධානය සමඟ මම වැඩකරන විටයි මුලින්ම සන්නස්ගල මට හමුවෙන්නේ.

නවකතාවක් ලියන්න තීරණය වුණේ කොහොමද?

මුලින්ම මම හිතුවේ කවි පොතක් කරන්න. ඒක මට හරිම ලේසි දෙයක්. මගේ කවි වල යම්කිසි ආකාරයක ගද්‍යමය ස්වරූපයක් තියනවා. ඒ ගද්‍ය තුළ මා හැසිරෙන කොට එය තුළින් මගේ අදහස් ප්‍රකාශ කරන්න ලේසි නෑ කියා පසුව මට දැණුනා. ඇයි මම නවකතාවකට යන්නේ නැත්තේ කියා හිතුණා. ඒ වෙනකොට නවකතාවක් ලියනවා කියන එකේ බය සහ අභියෝගය තිබුණා. ඒවත් තියාගන මම නවකතාවක් ලියන්න නවකතා කියවන්න පටන්ගත්තා.

ඊට කලින් මොනවද ඔබ කියවලා තිබුණ නවකතා ?

මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා කියවලා තිබුණා. ඊට පස්සේ පරිවර්ථන කියවමින් හිටියා. හරුකි මොරුකාන්ගේ භාෂා ශෛලියට මට ගොඩක් ආශා හිතුණා. එහි නූතන ලක්ෂණ ගොඩක් තිබුණා.

පරිවර්ථනවල මුල් ප්‍රකාශන කියෙව්වෙ නැද්ද?

පරිවර්ථන තමයි මුලින් කියෙව්වේ. හැබැයි සවිඥානික වෙන්න ඕනේ වුණාට පස්සේ ඉංග්‍රීසි පොතත් පැත්තකින් තියාගෙන දෙකම කියෙව්වා. එතකොට මට තේරුණා මොරුකාන්ගේ ශෛලිය ඇතුළේ මට හැසිරෙන්න පහසු බව. මගේ හැදෑරීම් කලාප තුළ හමුවූ ප්‍රශ්නයක් වුණේ ලංකාවේ භාෂාව තුළ ලිඛිත සහ කතා කරන කියා භාෂා ශෛලීන් දෙකක් තිබීමයි. ලිඛිත එක වඩා රාජ්‍යවාදියි. රාජ්‍යවාදීයි කියන්නේ මට මගේ ඉස්කෝලෙදි උගන්නපු 'මම' කියලා පටන්ගත්තම 'මි' යන්නෙන් වාක්‍ය ඉවර කළ යුතුයි කියන ව්‍යාකරණ ආකෘතියට. මොරුකාන්ගේ භාෂාව වුණේ කතා කරන ශෛලිය. ඒ තුළ මොනතරම් පහසුවෙන් චරිත ගොඩනැඟිය හැකිද කියා සිතී මම මගේ පොතට ඒ ශෛලිය තෝරාගත්තා.

ඔබ නවකතා ආකෘතිය තෝරාගන්නේ සමාජයට කුමක් සන්නිවේදනය කරන්නද? සමාජ සංවාදයකට බඳුන් කළ යුතු තරම් විශේෂිත යමක් ඔබට තිබුණාද?

ප්‍රේමය තමයි කතා කරන්න ඕනේ කියා මම හිතුවේ. කොහෙන් ගියත් පටිතය සැකසිය යුත්තේ ප්‍රේමයෙන්මයි කියා හිතුවා.

ප්‍රේමය කියන්නේ කලාව තුළ සුලබව කතා කරන මාතෘකාවක්. එසේ නොවුණු තව විෂයයන් විශාල ප්‍රමාණයක් තිබියදී ඇයි ප්‍රේමයම තෝරාගත්තේ ?

එකක් මම ආදරේ කරපු ගැහුණු ළමයා. අහිත් එක අපේ ගුරුවරයෙක් වෙච්ච රොහාන් පෙරේරාගේ චින්තනය. ඒවායේ මුළුමනින්ම තිබුණේ ප්‍රේමය. මම ඔහුගේ ලිපි කියෙව්වා. අහිත් එක තමයි කෞෂල්‍ය කුමාරසිංහ පරිවර්ථනය කළ 'ප්‍රේමය පසසනු වස්' කියන පොත. එයත් රොහාන් පෙරේරාගේ 'ආදරය සඳහා හෝර්ටන් තැන්න' කියන ලිපි මාලාවත් තමයි මගේ පොත ගොඩනැඟීමේ රෙෆරන්ස් විදිහට තියාගත්තේ.

මොකක්ද ඔබ ලියුව නවකතාව කියලා කෙනෙක් ඇහුවොත් ඔබ කොහොමද සංක්ෂිප්තව එය හඳුන්වා දෙන්නේ ?

ප්ලේටෝට ප්‍රේමය කියන්නේ පරම දෙයක් වුණා වගේ ප්‍රේමය කියන්නේ පාරභෞතික අදහසක්. ප්‍රේමය කියන්නේ වඩා හොඳම දෙය. එහෙනම් ඒක එන්න පුළුවන් දිව්‍ය ලෝකෙන් විතරයි. මොකද මේ ලෝකේ හොඳම දෙයක් කියලා දෙයක් නෑනේ. ප්‍රේමය කියන්නේ දිව්‍යමය ස්වරූපයකින් පැවතිය යුතු අසමසම දෙයක්ය කියන තැනදි මට හමුවෙනවා බුදුහාමුදුරුවන්. ප්‍රේමයේ පරමාදර්ශය තමයි බුදුරජාණන්වහන්සේ. මෙතනින් එහාට මට පොත ගැන මොකුත් කියන්න බෑ. මොකද මෙතනින් එහාට මම පොත ගැන මොකක් හරි කිව්වොත් පාඨකයාට පොත වැඩක් නැති වෙනවා. මොකද මේ පොත පාඨකයාගේ අර්ථකථන මිලියනයකට විවෘතයි. මම ආපහු යමක් කිව්වොත් වෙන්නේ මම කියන දෙයින් ඒක ඕවර්රයිට් වෙන එක.

කොහොමද ඔබට මේ බුදුන් හමුවෙන්නේ ?

මුලින්ම බුදුන්ව හමුවෙන්නේ මගේ ආච්චිගෙන්. එතකොට ආච්චි ඉන්නේ තිස්සමහාරාමෙ. කතරගම දෙවියන් සහ බුදුන් අතර නෑකමක් ගැන කතන්දර තියනවා. ආච්චි වෙලාවකට ගේ පිටිපස්සට ගිහිල්ලා මට කියනවා 'පුතේ අන්න වැඩිහිටි කන්දෙන් කතරගම දෙවියෝ බුදුන් එක්ක බහිනවා' කියලා. ලෝක අවසානය ගැන යසෝදරා ගැන කතා ආච්චි මට කියලා දීලා තියනවා. එතකොට මම පොඩි කාලේ ඉඳන්ම දැනගන්නවා බුදුන් කියන්නේ මගේ ඥාතියෙක් කියලා. හුරුපුරුදු කෙනෙක් කියලා දැනෙන්න ගත්තට පස්සේ මගේ තිබුණ බය නැතිවෙලා ගියා. ඔහොම මෙහෙම බුදුන් හිටයත් කතා කරන්න පුලුවන් කියන හැඟීමක් ආවා. ඒක තමයි මේකේ අධෝ ව්‍යුහය.

ඉන් පස්සේ ? බුදු දහම ගැන යම් හැදෑරීමක් කළාද ?

මම හඹුටානේ අභිනවාරාමයේ දහම් පාසලේ දීප්තිමත් ශිෂ්‍යයෙක්. හැම පාරම වගේ පන්තියේ පළවෙනියා. දහම් පාසලේ අපේ වයසේ මහණ වෙච්ච හාමුදුරුවරුන් මම ළඟින් ඇසුරු කළා. බුදු දහම ගැන කථිකාවතකට වැඩිය ඒගොල්ලන්ගේ ජීවිත ගැන කතා කරන එක තමයි සිදුවුණේ. අපි ක්‍රිකට් පවා ගැහුවා හාමුදුරුවරුත් එක්ක.

බුදු දහමේ මූලාශ්‍ර ගන්ථ වන ත්‍රිපිටකය පිළිබඳ යම් අධ්‍යනය කළාද?

ත්‍රිපිටකය වෙත දාර්ශණික එළඹුමක් කරන්න මට පසු කාලෙකදි සිදුවෙන්නේ සිනමාව ගැන හැදෑරීමේදී. වංගීස සුමනසේකරලා ඇතුළු පිරිසක් සමඟ අපි දර්ශනය ඉගෙන ගනිමින් යනවිට පෙනුන දෙයක් තමයි හැම මිනිහෙකුටම මාර්ග ඵලයක් ලැබුවා හා සමානව දාර්ශණිකයෙකු වෙන්න පුළුවන් කියන එක. මගේ මිතුරු හාමුදුරුවරු ත්‍රිපිටකය ගැන කතා කරනවා මම අහගෙන හිටියා. එහෙම තමයි ත්‍රිපිටකය හැදෑරීම කළේ. මම අමුතුවෙන් ත්‍රිපිටකය පෙරළගෙන කියවන්න උත්සාහ කළේ නෑ. හැම පොතක්ම කියවන්න ගියොත් අපිට ජීවිත කාලයම ඒකට මදිවෙන නිසා මම ක්‍රමවේදයක් හදාගෙන තිබුණා ඒ ගැන දන්න කියන අය එක්ක කතා කරලා දාර්ශණික සංවාද මගින් හදාරන්න. දර්ශනය හදාරණ අපේ කවයේ වරංගගෙන් තමයි මට ත්‍රිපිටකය ගැන මොකක් හරි දැනගන්න ඕනේ වුණාම මම අහගත්තේ. ඒ විදිහටයි සිදුවුණේ.

මේ පොතේ කථා නායක චරිතය ඉදිරියට යන අතරේ තැනින් තැන බුදුන් සහ බුදු දහම පිළිබඳ සඳහන් කිරීම් තිබෙනවා. 'බුද වුණා වගේ' වැනි උපමා තිබෙනවා. ඒ වගේ දේවල් යොදන්න බලපෑව හේතු මොනවාද?

මම මේ චරිතය හරහා ගොඩනඟන්න උත්සාහ කළේ සිංහල බෞද්ධ පෙම්වතාව. මේක අලුත් තත්ත්වයක්. ලංකාවේ පළමුවෙනි වතාවට වෙන්න පුළුවන් මේ යෙදුම මගේ අතින් කෙරෙන්නේ. සිංහල බෞද්ධ පෙම්වතා අතේ තියන කවියක් තමන්ගේ පෙම්වතියට දෙන්න යන ගමනක් තමයි පොතේ ආඛ්‍යානය වෙන්නේ. එයා ගෙයින් එළියට බැහැලා යනවා. නමුත් යන්නේ මොකටද කියන එක පොතේ මුල් හරියේදි ක්ලියර් නෑ. මම යන්නේ නන්නත්තාරෙද? මම බුදුවෙලාද? අපේ ගොඩක් යාලුවෝ ගෙදරින් යනවා වගේ තේරුමක් නැතිව යන කෙනෙක් ඒ. ඒ යනකොට පේන දැනෙන දේවල් සහ හිතන දේ අතර වෙනස හඳුනගන්න බැරි හින්නෝන්මාදී කෙනෙක් වෙන්නත් පුළුවන් මෙයා. පාඨකයා ඒ ටෙන්සන් එකේ දිගටම තියාගන්න තමයි මට ඒවා ඕනේ වෙන්නේ.

මේ පොතේ ඉලක්කගත පාඨක පිරිස කවුරුන්ද?

මේක උපාසක අම්මලාට ලියපු පොතක්. හැම උපාසක අම්මා කෙනෙක්ම මේ පොත කියවන්න ඕනේ කියන එක තමයි මගේ අදහස වුණේ. මොකද අපේ රටේ වැඩිහිටි ජනයා කළමනාකරණය කරගන්න රජයටවත් බෑ. ඒක කාටවත් තේරෙන්නේ නෑ. අපි ඔවුන්ව ගෙවල්වල සිරකරලා ලෙඩකරලා අන්තිමට මැරෙන්න අරිනවා. මේ සම්පත මැනේජ් කරගන්න අපිට තේරෙන්නේ නෑ. කොටින්ම කිව්වොත් මගේ ආච්චි දිහා බලාගෙන ආච්චිට ලියපු පොතක් මේක.

ආච්චි මේ පොත කියෙව්වද?

ආච්චි හිටියා නම් කියවයි. නමුත් ආච්චි නැතිවෙලා. අම්මා තමයි දැන් මේක කියවන්නේ. තවම කියවගෙන යනවා.

ප්‍රේමයයි ලිංගිකත්වයයි ගැන කතා කරන මේ වගේ පොතක් ඒ අයට අලෙවි කිරීම අභියෝගයක් නේද? කොහොමද මේක විකුණන්න හිතුවේ?

මගේ හැදෑරීම් ඇතුළේ මම හොයාගත්ත දෙයක් තමයි මේ තරම් බෞද්ධ රටේ අපි සතුටෙන් මැරෙන මිනිහා තවමත් හදලා නෑ. මම කියන්නේ අපි නටලා ගයලා මැරෙමු කියන එක. මරණයට ලංවෙලා ඉන්න අය තමයි අරගොල්ලන්. මේ අය පන්සල්වලට තමයි යන්නේ. ඔවුන්ව ක්‍රමානුකූලව මරණයට සූදානම් කරවන ආයතන බවට තමයි මේ පූජ්‍යස්ථාන පත්වෙලා තියෙන්නේ. බන කියමින් පන්සල් ඇතුළේ මේ අයව බිය ගන්වනවා. එහෙම කරන හාමුදුරුවරන්ට තමයි මේ පොත බන මඩුවට ගෙනියන්න වෙන්නේ. මේකටත් මාකටින් කියලා කියන්න පුළුවන්. මගේ ඒ සිතීමේ සිතියම අනුව තමයි පොතට මේ නම යෙදුවේ. ප්‍රඥාවේ සැරිසැරීම කියන අදහසිනුයි ඒක යොදුවේ. වෙන කුමන්ත්‍රණ තිබුණේ නෑ මේක ඇතුළේ.

පොත ප්‍රකාශනයට කලින් අත්පිටපත විෂය ප්‍රවීණයන්ට හෝ මිතුරු මිතුරියන්ට කියවන්න දීලා කිසියම් ප්‍රතිචාර විමසීමක් එහෙම කළාද?

නෑ. කාටවත් දුන්නේ නෑ. මොකද මට හිතුණා එහෙම කළොත් පොත මම ලියපු විදිහට වඩා ගොඩක් වෙනස් වෙයි කියලා. මුද්‍රණයට කලින් පොත කියෙව්වේ සෝදුපත් බලපු අය විතරයි.

පෙරවදනක් හෝ පොත් ප්‍රකාශනයේදී අනුගමනය කරන සම්මත ප්‍රමිතීන් කිසිවක් මේ පොතේ දකින්නට නෑ. ඇයි ඒ?

මේ මගේ පළවෙනි පොත සිනමාවක් හා සමාන කලා කෘතියක්. ඔබ දැකලා ඇති සමහර චිත්‍රපටි කෙලින්ම කතාවෙන් පටන්

49 වන පිටට